**වැලිගම ප්‍රාදේශීය සභාව - 2020**

**-------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**-------------**

### 1.1. තත්ත්වාගණනය කළ මතය

**-----------------------------**

වැලිගම ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට වැලිගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**----------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4. විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශිය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍යයන් සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පතනේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු කර්මාන්ත වියදම වෙනුවෙන් රු.98,145 ක් ණයහිමි යටතේ ප්‍රතිපාදන සලස්වා නොතිබුණි. | ඉදිරියේ දී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට පැලැන පිහිටි කාර්යාල ගොඩනැගිල්ලේ වටිනාකම රු. 18,703,804 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද ස්ථාවර වත්කම් ලේඛනය අනුව රු.18,520,035 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ප්‍රාග්ධනිත කරන ලද අගය ඉඩම් ගොඩනැගිලි ලේඛණයෙහි සටහන් නොකිරීම වෙනසට හේතු වී ඇති බව. | |
| (ඇ) | සභාවේ ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම තක්සේරු කර යාවත්කාලීනව ගිණුම්ගත කර නොතිබූ අතර සභාව සතු ඉඩම් 14 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | ඉඩම් ගොඩනැගිලි සමීක්ෂණය අවසන් වූ පසු වටිනාකම් තක්සේරු කර ගිණුම් ගත කරන බව. | |
| (ඈ) | 2018 වර්ෂය තුළ සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝටල් 03 කට අදාලව ලැබිය යුතු බලපත්‍ර ගාස්තු රු.190,832 ක් අනුමැතියකින් තොරව කපා හැරීම නිසා ලැබිය යුතු බලපත්‍ර ගාස්තුව එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | ගිණුම්ගත කරන ලද වටිනාකමත්, සත්‍ය වශයෙන් ලැබිය යුතු මුදලත් අතර රු.190,832 ක අධි වෙන් කිරීම කපා හැර ඇති බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඉ) | ප්‍රතිපූර්ණය නොවූ වීථි පහන් සඳහා දරන ලද රු.767,480 ක වියදම අතිරික්තතා ඌනතා ගිණුමට රු.1,137,290 ක් ලෙස කපා හැරීමෙන් එම ශේෂය රු.369,810 ක් අඩුවෙන් ගිණුම්ගත වී තිබුණි. | මුදල් ප්‍රතිපූර්ණය නොකිරීම නිසා කපා හැරීම් සිදු කර ඇති බවත් ඉදිරියේ දී එය නිවරදි කිරීමට කටයුතු කරන බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

--------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.95,226,175 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.88,203,142 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

----------------------

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

---------------------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට රු.16,076,408 ක් වරිපනම් හිඟව පැවතුණි. | ඉදිරියේ දී රටේ සෞඛ්‍ය තත්වය යහපත් වූ පසු හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අය කරගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට රු.1,847,897 ක් කුලී හිඟව පැවතුණි. | 2021 අප්‍රේල් 30 වන විට එම හිඟ මුදලින් රු.58,798 ක් අය කර ගෙන ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අය කරගත යුතුය. |

#### 2.2.2 අධිභාර

--------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිවයුතු අයවලුන්ට එරෙහිව මවිසින් ඉකුත් වර්ෂයේදී රු.7,487,954 ක් වූ අධිභාර 09 ක් පනවා තිබුණි. | 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 172 (3) ප්‍රකාරව අධිභාර අයකර ගැනීමේ වගකීම පළාත් පාලන කොමසාරිස්ගේ වගකීමක් බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

----------------------------

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| ජලනල එලීමේදී මාර්ගවලට සිදු කරන හානි වෙනුවෙන් ගාස්තු අය කිරීමේදී සභාවේ තක්සේරු නිලධාරියෙකු මගින් තක්සේරු කර නොතිබුණ අතර අයකර ගෙන තිබූ රු.392,604 ක ගාස්තු යොදා මාර්ග නැවත පිළියෙල කර නොතිබුණි. | ජල නල එලීමේ දී මාර්ගවලට සිදුවන හානි පිළිසකර කිරීමක් මේ වන තෙක් සභාව මඟින් සිදු කර නොමැති අතර ඉදිරියේ දී මෙම මාර්ග පිළිසකර කිරීමට කටයුතු කරන බව. | ගාස්තු අය කිරීම විධිමත් පරිදි සිදු කළ යුතුය. |